# සමාජ සේවා දෙපාර්තමේන්තුවේ වෘත්තීය පුහුණු ආයතන සඳහා අභ්‍යාසලාභීන් බඳවාගැනීම සඳහා වූ චක්‍රලේඛය

2018

චක්‍රලේඛ අංක: **SSD/**09/**201**7

මගේ අංකය: SSD/4/2/1-1
සමාජ සේවා දෙපාර්තමේන්තුව,
02 වන මහල,
සෙත්සිරිපාය, II අදියර
බත්තරමුල්ල.
2017.06.

ප්‍රාදේශීය ලේකම් මගින්,
සමාජ සේවා නිලධාරී,
සමාජ සංවර්ධන සහකාර,
සංවර්ධන නිලධාරී ( සමාජ සේවා )
......................................................
......................................................

**සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ පවත්නා වෘත්තීය පුහුණු ආයතන සඳහා අභ්‍යාසලාභීන් බඳවා ගැනීම**

**(2018 ජනවාරි 01 දින සිට ආරම්භ කිරීමට නියමිත පාඨමාලා සඳහා අයදුම්පත් කැඳවීම)**

ආබාධ සහිත පුද්ගලයින් හට රැකියාවක හෝ ස්වයං රැකියාවක නිරතවීමට හැකිවන පරිදි කිසියම් වෘත්තීය පුහුණුවක් ලබාදීම සඳහා සමාජ සේවා දෙපාර්තමේන්තුව කටයුතු යොදා ඇත. වෘත්තීය පුහුණුව යන්න හුදෙක් පුහුණුවීමකට පමණක් සීමා නොවී රැකියාවක් ලබාගැනීමට හෝ ස්වයං රැකියාවක් කිරීමට ආබාධිත පුද්ගලයෙකුට අනිවාර්යය මඟ පෙන්වීමක් විය යුතුය. සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ පවත්නා වෘත්තීය පුහුණු ආයතනවල වෘත්තීය පුහුණුවට බඳවාගනු ලබන අභ්‍යාසලාභීන් පහත සුදුසුකම් සපුරා තිබීම අත්‍යවශ්‍ය වේ.

**01. වෘත්තීය පුහුණුව සඳහා තෝරාගනු ලබන්නා -**

(i) ශ්‍රී ලාංකික පුරවැසියෙක් වීම.
(ii) විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයෙකු වීම.
(iii) අවිවාහක වීම.
(iv) වයස් සීමාව අවුරුදු 16 – 35 අතර වීම.
(iii) පුහුණු පාඨමාලාවට අදාළ වන පරිදි අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.

**02. වෘත්තීය පුහුණුව සඳහා බඳවාගැනීම -**

ග්‍රාම නිලධාරී, සමාජ සේවා නිලධාරී, සමාජ සංවර්ධන සහකාර, සංවර්ධන නිලධාරී( සමාජ සේවා ), පළාත් සමාජ සේවා නිලධාරී, උපකෘත පාසැල්වල විදුහල්පතිවරුන්, මඟින් වෘත්තීය පුහුණුවට බඳවාගැනීම සඳහා අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

**03. වෘත්තීය පුහුණුව සඳහා පුද්ගලයින් තෝරාගැනීම -**

සමාජ සේවා දෙපාර්තමේන්තුව විසින් නම් කරනු ලබන නියෝජිතයෙකු හෝ නියෝජිත මණ්ඩලයක මෙහෙයවීම යටතේ කරනු ලබන ලිඛිත හෝ ප්‍රායෝගික සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත වෘත්තීය පුහුණුව සඳහා තෝරා ගැනීම සිදුකෙරේ.

| 04. | **වෘත්තීය පුහුණු පාඨමාලා වර්ග** | **කාල සීමාව** |
| --- | --- | --- |
| 1. | පරිගණක - Computer | අවුරුදු 02 |
| 2. | ගුවන් විදුලි යන්ත්‍ර, රූපවාහිනී යන්ත්‍ර සහ ආශ්‍රිත උපකරණ කාර්මික ශිල්පය - Radio, TV and Allied Equipment Repairing | අවුරුදු 02 |
| 3. | වඩු කාර්මික හා ලී කැටයම් ශිල්පය - Wood Craft & Wood Carving | අවුරුදු 02 |
| 4. | ඇඳුම් මැසීමේ ශිල්පය- Dress Making | අවුරුදු 02 |
| 5. | මෝටර් රථ කාර්මික ශිල්පය - Automobile Mechanic | අවුරුදු 02 |
| 6. | ගෙවතු වගා කෘෂිකාර්මික ශිල්පය - Home Garden Agriculture | අවුරුදු 02 |
| 7. | ත්‍රිරෝද රථ හා යතුරුපැදි කාර්මික ශිල්පයThree Wheel & Motorcycle Repair | අවුරුදු 02 |
| 8. | හස්ත කර්මාන්ත ( විසිතුරු / අත්කම් ) Handicraft / Ornament | අවුරුදු 02 |
| 9. | ශීතකරණ හා වායු සමීකරණ කාර්මික ශිල්පිය - Refrigeration and Air Conditioning Mechanic | අවුරුදු 01 |
| 10. | වෙලරින් ශිල්පය - Tailoring | අවුරුදු 01 |
| 11. | සම්බාහන චිකිත්සාව -Therapeutic Massage | අවුරුදු 01 |
| 12. | හස්ත කර්මාන්ත ශිල්පය ( උණ / පොල් ) – Handicraft ( Bamboo & Coconut ) | අවුරුදු 01 |
| 13. | හස්ත කර්මාන්ත ශිල්පය (රෙදි නිර්මාණ) -Handicraft (Fabric Design) | අවුරුදු 01 |
| 14. | හස්ත කර්මාන්ත ශිල්පය (වේවැල් හා කොහු) - Handicraft (Cane & Coir) | අවුරුදු 01 |
| 15. | හස්ත කර්මාන්ත ශිල්පය (විසිතුරු)- Handicraft Ornament | අවුරුදු 01 |
| 16. | හස්ත කර්මාන්ත ශිල්පය (කොසු හා ඉදල්) -Handicraft (Broom & Eakle broom) | අවුරුදු 01 |
| 17. | පෙදරේරු කාර්මික ශිල්පය - Masonry | අවුරුදු 01 |
| 18. | යන්ත්‍ර ශිල්පය - Machining | අවුරුදු 01 |
| 19. | විදුලි ශිල්පය - Electrical | අවුරුදු 01 |
| 20. | මෝටර් රථ පින්තාරු ශිල්පය - Automobile Painting | අවුරුදු 01 |
| 21. | පෑස්සුම් ශිල්පය - Welding | අවුරුදු 01 |
| 22. | සිමෙන්ති නිෂ්පාදන ශිල්පය - Cement Product Making | අවුරුදු 01 |
| 23. | පාවහන් හා සම් කර්මාන්ත ශිල්පය - Footwear & Leather Craft | අවුරුදු 01 |
| 24. | බතික් නිර්මාණ ශිල්පය - Batik | අවුරුදු 01 |
| 25. | බේකරි / ආහාර සැකසුම් ශිල්පය - Baker & Cook | අවුරුදු 01 |
| 26. | පේෂ කර්ම ශිල්පය - Hand weaving | අවුරුදු 01 |
| 27. | රූපලාවන්‍ය - Beauty Culture | අවුරුදු 01 |
| 28. | මහන යන්ත්‍ර ක්‍රියාකරවීම (කර්මාන්ත ශාලා) - Industrial Sewing Machine Operating | අවුරුදු 01 |
| 29. | ආහාර තාක්ෂණ Cookery | අවුරුදු 01 |

ආබාධිත තත්වයන්

01. දෘෂ්‍යාබාධිත
02. කථන ආබාධිත
03. කායික ආබාධිත
04. බුද්ධිමය ආබාධිත
05. ශ්‍රවණාබාධිත
06. සුසුම්නා ආබාධිත

**06. වෘත්තීය පුහුණු ආයතනයන්**

| අනු අංක | වෘත්තීය පුහුණු ආයතනය හා ලිපිනය | දුරකතන / ෆැක්ස් / ඊමේල් |
|---|---|---|
| 01 | සීදූව වෘත්තීය පුහුණු ආයතනය<br>ලියනගේමුල්ල, සීදූව | 0112 - 253503<br>vtcseeduwasrilanka@gmail.com |
| 02. | අමුණුකුඹුර වෘත්තීය පුහුණු ආයතනය<br>අමුණුකුඹුර, වතුරුගම | 033 - 2279321<br>vtiamunukumbura@gmail.com |
| 03. | කැටවල වෘත්තීය පුහුණු ආයතනය<br>කැටවල, ලෙව්ල, මහනුවර | 081 – 2219153<br>katawalavti @gmail.com |
| 04. | වත්තේගම වෘත්තීය පුහුණු ආයතනය<br>වාවින්න, වත්තේගම | 081 – 2476209<br>socialservices.vtiwattegama@gmail.com |
| 05. | තෙළඹුයාය වෘත්තීය පුහුණු ආයතනය<br>තෙළඹුයාය, අඟුණකොළපැළැස්ස | 047 – 3489296<br>Thelambuyayavtc@gmail.com |
| 06. | රාගම වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය<br>පුනරුත්ථාපන රෝහළ, රාගම | 0112 – 958294<br>0112 – 2958212<br>ragamavtc@gmail.com |
| 07. | මාදම්පේ වෘත්තීය පුහුණු ආයතනය, පොතුවිල, මාදම්පේ | 032- 2248568<br>vtcssdoffice.madampe@gmail.com |
| 08. | කළවාන වෘත්තීය පුහුණු ආයතනය, කුකුලේගම, කළවාන | 045 –2255017<br>wgobgunasekara@gmail.com |

## 07. දෛනික දීමනා

පුහුණුව ලබන කාලසීමාව තුළ දෛනික දීමනාවක් වශයෙන්,

(i) වෘත්තීය පුහුණුව ලබන නේවාසික හෝ නේවාසික නොවන අභ්‍යාසලාභීන් සඳහා දෛනික දීමනාව රු. 150/-

මෙම දෛනික දීමනාව කාලීන අවශ්‍යතාවය මත වෙනස් විය හැකි අතර මෙසේ ලබාදෙන මුදල වේතනයක් හෝ වෙනත් ව්‍යවස්ථාපිත ගෙවීමක් ලෙස නොසැලකෙන අතර පුහුණුව ලබන කාල සීමාව තුළ දී අදාළ අයගේ මූලික අවශ්‍යතාවයන් සපුරාගැනීම සඳහා දෙනු ලබන හුදෙක්ම දීමනාවක් පමණි.

## 08. විශේෂ පහසුකම් හා අවස්ථා

i. පාඨමාලාව අවසානයේ පිළිගත් සහතිකයක් නිකුත් කිරීම
ii. පුද්ගලික අංශයේ රැකියා සඳහා මාර්ගෝපදේශනය
iii. නායකත්ව පුහුණු
iv. නොමිලේ නේවාසික පහසුකම් හා ආහාරපාන (බාහිර පුහුණුලාභීන් සඳහා ආහාරපාන සපයනු නොලැබේ)
v. නොමිලේ නිල ඇඳුම් හා දෛනික අවශ්‍යතා (දත් බුරුසු, දත් බෙහෙත්,සබන්, රේසර්)
vi. පැමිණීම අනුව දෛනික දීමනාවක්
vii. මැහුම් පාඨමාලාවන් හදාරනු ලබන අභ්‍යාසලාභීන් සඳහා පුහුණුවෙන් පසු ස්වයං රැකියාවක නිරත වීමට මහන මැෂිමක් ලබාදීම
viii. පුහුණුවෙන් පසු ස්වයං රැකියාවක නිරතවන පුහුණුලාභීන් සඳහා රු. 15000 /- ක උපකරණ කට්ටලයක්
ix. නොමිලේ වෛද්‍ය ප්‍රතිකාර
x. නවීන තාක්ෂණික මෙවලම් භාවිතය
xi. සමාජ සංවර්ධන වැඩසටහන්
xii. යෞවන කටයුතු හා ක්‍රීඩා
xiii. කලා හා සෞන්දර්යය
xiv. ජාතික හා ජාත්‍යන්තර තරඟ සඳහා ඉදිරිපත්කිරීම
xv. අධ්‍යාපන චාරිකා / විනෝද චාරිකා හා විවිධ ප්‍රසංග

**09. වෙනත් විශේෂිත කරුණු**

01. පිළිගත හැකි හේතුවක් මත නොදන්වා පාඨමාලාවන් අතර මැද හැරයන අභ්‍යාසලාභීන් නැවත වෘත්තීය පුහුණුව සඳහා බඳවා ගනු නොලැබේ. අසනීපයක් හෝ වෙනත් පිළිගතහැකි හේතුවක් මත නියමිත පාඨමාලාවට සහභාගීවීමට නොහැකිවූ අභ්‍යාසලාභීන් සඳහා සමාජ සේවා අධ්‍යක්ෂගේ විශේෂ අනුමැතිය යටතේ පුහුණු කාලසීමාව දීර්ඝකළ හැක.

02. වෘත්තීය පුහුණුව ලබන කාලසීමාව තුළ ආයතනයට හානිදායක වන හෝ විනය නීති කඩකරමින් හැසිරෙන අභ්‍යාසලාභීන් පිලිබඳ සමාජ සේවා අධ්‍යක්ෂ වෙත දැන්වීමෙන් අනතුරුව පාඨමාලාවෙන් ඉවත් කරනු ලැබේ.

03. සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ පවත්නා වෘත්තීය පුහුණු ආයතන වලින් වෘත්තීය පුහුණුව අවසන් කර පිටවන අභ්‍යාසලාභීන්ගේ පසුහාර කටයුතු සිදු කිරීමට අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල සමාජ සේවා නිලධාරී, සමාජ සංවර්ධන සහකාර, සංවර්ධන නිලධාරී(සමාජ සේවා) හා අවස්ථානු කූලව වෘත්තීය පුහුණු ආයතන භාර අධිකාරී/ ස්ථාන භාර නිලධාරී මඟින් සිදු කරනු ලැබේ.

04. අභ්‍යාසලාභීන් බඳවා ගැනීමේ අයදුම්පත් සමාජ සේවා දෙපාර්තමේන්තුව වෙත 2017 අගෝස්තු මස 31 දිනට පෙර ලැබීමට සැලැස්විය යුතුය.

**05. ඔබ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන් අවම වශයෙන් අභ්‍යාසලාභීන් 05 දෙනෙකුවත් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කල යුතුය.**

06. අයදුම්පත් <u>**අධ්‍යක්ෂ, සමාජ සේවා දෙපාර්තමේන්තුව, 02 වන මහල, II අදියර, සෙත්සිරිපාය, බත්තරමුල්ල**</u> යන ලිපිනයට එවිය යුතුය.

07. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර දැනගැනීමට අවශ්‍ය නම් **0112187050** හෝ **0112186010** යන දුරකථන අංක මගින් තොරතුරු ලබාගත හැකිය.

ප්‍රදීප් යසරත්න

සමාජ සේවා අධ්‍යක්ෂ

**පිටපත් -**

01. ලේකම්, සමාජ සවිබලගැන්වීම්, සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය - කරු. දැ.ගැ.ස.
02. දිස්ත්‍රික් ලේකම්වරුන් - කරු. දැ.ගැ.ස. හා අ.ක.ස.
03. ප්‍රාදේශීය ලේකම්වරුන් - කරු. දැ.ගැ.ස. හා අ.ක.ස.
04. ප්‍රධාන ගණකාධිකාරී - කරු. දැ.ගැ.ස.
05. පළාත් සමාජ සේවා අධ්‍යක්ෂකවරුන් - කරු. දැ.ගැ.ස.
06. සහකාර අධ්‍යක්ෂ (පාලන) - කරු. දැ.ගැ.ස.
07. අධිකාරී / ස්ථාන භාර නිළධාරී - කරු. දැ.ගැ.ස. හා අ.ක.ස.
08. දිස්ත්‍රික් සමාජ සේවා නිළධාරී - කරු. දැ.ගැ.ස. හා අ.ක.ස.
09. විදුහල්පතිවරුන් - උපකෘත පාසැල් - කරු. දැ.ගැ.ස. හා අ.ක.ස.
10. සභාපති / අධ්‍යක්ෂ / ස්වේච්ඡා සංවිධාන - කරු. දැ.ගැ.ස. හා අ.ක.ස.

**සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය**
**සමාජ සේවා දෙපාර්තමේන්තුව**
**වෘත්තීය පුහුණුවට තෝරා ගැනීමේ අයදුම් පත්‍රය**

1. දිස්ත්‍රික්කය :- ........................................ 2. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය :- ..............................................

3. ග්‍රාම නිලධාරී වසම :- .......................... 4. ගෘහ මූලික අංකය :- ...............................................................

5. ගෘහ මූලිකයාගේ නම :- ..........................................................................................................................................

6. ඔහුගේ/ඇයගේ ජාතික හැඳුනුම්පත් අංකය :- .....................................................

7. දුරකථන අංකය :- ..................................................

8. **ආබාධ ඇති පුද්ගලයාගේ තොරතුරු**

8:1 සම්පූර්ණ නම :- ..............................................................................................................

8:2 ඔහුගේ/ඇයගේ ජාතික හැඳුනුම්පත් අංකය :- ...................................................................................

8:3 ඔහුගේ/ඇයගේ උපන් දිනය :- .....................................

8:4 ඔහුගේ/ඇයගේ ස්ත්‍රී/පුරුෂ භාවය:- .............................................

8:5 ඔහුගේ/ඇයගේ ස්ථිර ලිපිනය :- ........................................................................................ …..

..............................................................................................................

8:6 ආබාධිත තත්ත්වය :- ...................................................................................

**9.** **අධ්‍යාපන තොරතුරු**

9:1 දැනට ලබා ඇති අධ්‍යාපන සුදුසුකම් :-

.........................................................................................................................................................

9:2 වෙනත් හැකියාවන් හා කුසලතාවන් :-

.........................................................................................................................................................

.........................................................................................................................................................

**10.** **පවුලේ විස්තර**

10.1. මව/ පියා/ භාරකරු රැකියාවක් කරයි | ඔව් | නැත |

10.2. ඔහුගේ /ඇයගේ රැකියාව ...................................................................................................................

10.3. පවුලේ සිටින සහෝදර / සහෝදරියන් ගණන (අ) සහෝදරයන් ................ (ආ) සහෝදරියන් .............

10.4. පවුලේ වෙනත් ආබාධිත අය සිටීද ? | ඔව් | නැත |

10.5. සිටිනම් ඒ කවුරුන්ද ?

(අ) මව / පියා ........................ ( ආ) සහෝදර / සහෝදරියන්.................... (ඇ) වෙනත්......................

ඉහත තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික වෙමි.

...................................................................
අයදුම්කරු /මව /පියා හෝ භාරකරුගේ අත්සන.

**11**. වෘත්තීය පුහුණුවට බඳවා ගැනීම නිර්දේශ කරමි.

................................ .................................... ..................................................
සමාජ සේවා නිළධාරි /සමාජ සංවර්ධන සහකාර /සංවර්ධන නිළධාරි ( සමාජ සේවා )

( නිල මුද්‍රාව )

**ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය**

නිර්දේශ කරමි /නොකරමි.

...........................................
ප්‍රාදේශීය ලේකම්

දිනය :-............................................. ( නිල මුද්‍රාව )